www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඓතිහාසික කඩාවැටීම සහ සමාජවාදය සඳහා ඇති අවකාශ

## The historic decline of US imperialism and the prospects for socialism

**හතර වන කොටස**

**නික් බීම්ස්**

**2005 පෙබරවාරි 04**

ජනවාරි 29-30 සති අන්තයේ දී, සමාජවාදී සමානතා පක්ෂය (සසප) ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවත්වී ය. පහත පල කරන්නේ ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික නික් බීම්ස් ඉදිරිපත් කල ආරම්භක වාර්තාවේ හතර වෙනි සහ අවසාන කොටස යි.

එක්සත් ජනපද ආර්ථික පරිහානිය හා සමස්තයක් ලෙස ලෝක ධනවාදයට එහි ඇති සම්බන්ධතාව පිලිබඳ මෙම විශ්ලේෂනයෙහි එක්ව ගත් ඇඟවුම් ගෙනහැර දක්වීමට මට ඉඩ දෙන්න.

පැරනි පර්යාය බිඳවැටීම සරල වසයෙන් ම ආක්‍රමනකාරී බුෂ් පරිපාලනයේ නිෂ්පාදනයක් හා වෙනත් පාලන තන්ත්‍රයක් එම තැනට පත් කල හොත් විසඳිය හැක්කක් නො වේ. මා කිසිදු අයුරකින් එක්සත් ජනපද පාලක පන්ති කොටස්වල, එක්කෝ මඟ වෙනස් කිරීමේ උත්සාහයක් ලෙස හෝ නැත හොත් නව පරිපාලනයක් බලයට ගෙන ඒමට හෝ, මැදිහත් වීමේ හැකියාව බැහැර නො කරමි. සියල්ලට පසුව, වත්මන් ගමන ආර්ථිකව ද දේශපාලනිකව ද විනාශයක් කරා යොමුව ඇතැයි පුලුල්ව පැතිරුනු හා වැඩෙන කනස්සල්ලක් පවතියි. කෙසේ වුවද අවධාරනය කල යුත්තේ එක්සත් ජනපද මිලිටරිවාදයේ පුපුරායෑම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඓතිහාසික පිරිහීමේ නිමැවුමක් බව යි.

තවමත් එක්සත් ජනපදය නැගඑමින් තිබෙන අධිරාජ්‍යවාදී බලවේගයක්ව පැවති 1920 ගනන්වල ප්‍රධාන බලවතුන් අතර සම්බන්ධතාවය විශ්ලේෂනය කරමින් ට්‍රොට්ස්කි සඳහන් කලේ, අර්බුද කාලයක ඇමරිකානු ආධිපත්‍යය හීන වනවා වෙනුවට ''එහි අනෙක් පැත්ත සිදුවනු ඇති බව යි. අර්බුද කාලයක දී එක්සත් ජනපද ආධිපත්‍යය උත්පාත කාලයකදී ට වඩා පරිපූර්නවත්, වඩා විවෘතව හා වඩා නිර්දය ලෙසත් ක්‍රියාත්මක වනු ඇත. එක්සත් ජනපදය ප්‍රධාන කොට ම යුරෝපයේ වියදමෙන් ඇගේ දුෂ්කරතාවන් හා ව්‍යාධීන්ගෙන් ගැලවීමට හා ඒවා ජයගැනීමට, මෙය සිදුවන්නේ ආසියාවේ, කැනඩාවේ, දකුනු ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ හෝ යුරෝපයේ ම ද, එය සිදුවන්නේ යුද්ධයෙන් ද සාමයෙන් ද යන්න හෝ නො සලකා කටයුතු කරනු ඇත.'' [ට්‍රොට්ස්කි - *TheThird International after Lenin,* (ලෙනින්ගෙන් පසු තුන්වන ජාත්‍යන්තරය,) පිටු 8]

දෙවැනි ලෝක සංග්‍රාමයෙන් පසුව ගැටගසනලද පැක්ස් ඇමරිකානාවක් (බලහත්කාරී ඇමරිකානු සංහිඳියාව) මුල් බැස්සවූයේ සියල්ලටත් වඩා ධනේශ්වර පර්යාය ප්‍රතිනිර්මානය කිරීමට එක්සත් ජනපදයට පැවති හැකියාව තුල, අතිරික්ත වටිනාකම් මිරිකා ගැනීමට හා සමුච්ඡය වීම විශාල ලෙස වැඩිවීමේ ප්‍රතිඵල වසයෙන් ධනේශ්වර සංවර්ධනයේ වක්‍රයෙහි නව ඉහල නැග්මක් සඳහා කොන්දේසි නිර්මානය කිරීම වැනි වූ මාර්ගයකින් ය.

පරිගනකකරනයෙන් ඇති වූ ශ්‍රම ඵලදායීතාවයේ නිසැක ඉහල යෑමේ ද නිෂ්පාදන ක්‍රියාවලියේ සියලු වෙනස්කම් ද තිබිය දීත් ධනේශ්වර සංවර්ධනයේ වක්‍රය නව ඉහල නැගීමක් ඇරඹුවේ නැත. වසර තිහකට පෙර ආරම්භ වූ ලාභානුපාතිකයන් පහලට හෙලීමේ නැඹුරුව දිගටම ක්‍රියාත්මක වේ.

සත්තකින් ම ''ව්‍යුහාත්මක නිවැරදි කිරීම්'' සඳහා මූල්‍ය ප්‍රාග්ධනයෙන් කෙරෙන බලපෑම් ද, ඇතුලත් මෙම පීඩනය ජයගැනීම සඳහා මංමුලා සහගත උත්සාහයන් පවතී. ''පැහැර ගැනීම මගින් සමුච්ඡය'' ලෙස එක් ලේඛකයෙකු අංගලක්ෂනය කල ක්‍රියාවලියක් මෙයට බද්ධ වී ඇති අතර ඒ ස්වාභාවික සම්පත් කොල්ලකෑම සෞඛ්‍ය පමනක් නොව අධ්‍යාපනය ද ජලය ද වැනි පෙර සපයන ලද පොදු සේවාවන් පුද්ගලීකරනය හා ලෝකයේ දුගී ම රටවල් සමහරකගෙන් මූල්‍ය අනුග්‍රහයන් මිරිකා ගැනීම ය.

[ඩේවිඩ් හාවි - *The New Imperialism*, (නව අධිරාජ්‍යවාදය.)]

පැහැරගැනීම මගින් සමුච්ඡය සඳහා විශාල ගෝලීය අතිරික්ත ශ්‍රම හමුදාවක් තබා ගැනීම ලාභානුපාතිකයේ පහල වැටීමේ නිරන්තර ප්‍රවනතාවය හරස්කැපීම සඳහා අවශ්‍ය අරගලයේ දී ශ්‍රම වියදම් මත පහල හෙලීමේ පීඩනයක් සැම විටම පවත්වා ගෙන යාම ද ඇතුලත් ය.

එහෙත් මෙම ක්‍රියාවලියම, ලෝක ධනවාදයේ ප්‍රධාන කාර්මික මධ්‍යස්ථානය බවට පත්ව තිබෙන චීනය තුල විශේෂ වසයෙන්, යෝධ සමාජ හා පන්ති අරගලයන් පැන නැංවීමට තර්ජනය කරයි. දේශපාලන හා ආර්ථික ස්ථායීතාවය රඳා ඇත්තේ සියල්ලටමත් වඩා බීජිං හි ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය බහු මිලියනයක් කම්කරුවන් මර්දනය කිරීම මත ය. එය දිගටම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම තන්ත්‍රය සතු හැකියාව සමස්තයක් ලෙස ලෝක ධනවාදයේ අවධානයට ලක්වන වැදගත් කාරනයක් බව බ්‍රෙසින්ස්කි සඳහන් කරයි. කෙසේ වුවද මෙම මර්දනයේ මූලික යාන්ත්‍රනයට - ගොවි පදනමක වූ හමුදාව - ධනවාදී ප්‍රසාරනයේ එම ක්‍රියාවලිය මගින් ම වල කපයි. ලාභ ශ්‍රමය මත පදනම් වූ චීනයේ කාර්මිකකරනය රඳා ඇත්තේ ගොවීන්ගේ ආර්ථික සුරක්ෂිතභාවය විනාශ කරමින් මිලියන ගනන් ගොවීන් ඉඩම්වලින් නගර කරා දක්කීම මත වන අතර එමගින් පාලන තන්ත්‍රයට එරෙහිව කම්කරු පන්තියේ හා ගොවි සමූහයේ ඒකාබද්ධ අරගලයක් සඳහා කොන්දේසි සකසයි.

ලෝකයේ සමස්ත කලාපයන්හි ම, පැරනි නිෂ්පාදන රටාවන් හා ආර්ථික සංවිධාන, මූල්‍ය ප්‍රාග්ධනයේ බලපෑම හමුවේ කැලිවලට ඉරා දමයි. මෙහිදී ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි සංවිධාන සමග එක්ව කටයුතු කරමින් එක්සත් ජනපදය, ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. යමෙක් කල යුත්තේ කලෙක ''ආශ්චර්යමත්'' ලෙස සැලකූ ආර්ථිකයන් මූල්‍ය අර්බුදයකට ඇද වැටුනු වහාම, ''ප්‍රතිව්‍යුහකරනය'' සඳහා ජා.මූ.අ. දිගු කලක් තිස්සේ සූදානම්කල නිර්දේශ ලැයිස්තුවකට මුහුන දුන් 1997-98 ආසියානු අර්බුදය, සිහියට නගා ගැනීම පමනකි. විදේශ ප්‍රාග්ධනයේ සියල්ලටමත් වඩා එක්සත් ජනපද ප්‍රාග්ධනයේ විනිවිදීම සඳහා කලාපය විවෘතකර ගැනීමේ සාරය වන්නේ එය යි.

කෙසේ වුවද මෙම න්‍යායපත්‍රය ක්‍රියාත්මක කිරීමෙන් එක්සත් ජනපදය ගැටලු රැසකට මුහුන පෑවේ ය. එහි ක්‍රියාමාර්ගය ''නිදහස් වෙලඳපොල'' හා ''තරඟකාරීත්වය'' යන පතාක පුවරු යටතේ ගෙන ගිය අතර, ධනේශ්වර තන්ත්‍රයන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම වැනි ඒවායේ හිතසුව පිනිස තරඟය කිසි විටෙක යොදා නො ගත් බව යමෙක් කවර විටෙකවත් අමතක නො කල යුතු ය. තරඟකාරීත්වයේ අරමුන සැමවිට ම ප්‍රතිවාදියා පිටුදැකීම හා ඒකාධිකාරයක් හෝ ඊට සමාන තත්වයක් අත්කරගැනීම ය. නිදහස් වෙලඳපොල තුල වඩා බලගතු ප්‍රතිවාදීන් නැගී එනු දැකිය හැකි අතර මෙය සිදු නොවීම සහතික කරන පියවර ගත යුතුව තිබුනි.

## මහා බලවතුන්ගේ ප්‍රතිවාදය

මේතාක් දුරට වඩාත් උග්‍ර ප්‍රශ්නය ඉරාකය යි. සදාම් හුසේන් පාලනය යටතේ ඉරාක තෙල් සම්පත් විවෘත කිරීම, එක්සත් ජනපද ප්‍රධාන ප්‍රතිමල්ලයන්ට වාසිදායක විය හැකි ව තිබුනි. තෙල් ගවේශනයේ හා සංවර්ධනයේ දී ක්‍රියාශීලී තැනකට පත්ව සිටි ප්‍රන්සය, ජර්මනිය හා චීනය පවා එබැවින් ආක්‍රමනයේ හා පාලන තන්ත්‍රය වෙනස් කිරීමේ අරමුන හුදෙක් ''නිදහස් වෙලඳපොල'' පිහිටුවීම නොවූ අතර -- බ්‍රීමර් පරිපාලනයේ කටයුතුවලින් එකක් වූයේ, විදේශ ආයෝජන හා පෞද්ගලික අයිතිය සහතික කරන නීති මාලාවක් සම්පාදනය කිරීම ය. -- විභව ප්‍රතිවාදීන් තුරන්කිරීම විය. කෙරී වැනි බුෂ් පරිපාලනයේ විවේචකයන් කිහිප වාරයකදී ම සඳහන් කල කාරනය, යුරෝපීයන් සම්බන්ධ කරගැනීමට නම්, එක්සත් ජනපදය ඔවුන්ට සහන හා වාසි පිරිනැමිය යුතු බව යි.

එම ක්‍රියාවලියම කොරියාව තුලදී ද දැකිය හැකි ය. උතුරු කොරියානු න්‍යෂ්ටික අවි ගැටුමේ ගොතනු ලැබූ ස්වභාවය ෆොරින් එෆෙයාර්ස් සඟරාවේ අලුත්ම කලාපයේ පෙන්වා දී තිබේ. 2002 ඔක්තෝබරයේ දී අර්බුදය පැන නැංගේ උතුරු කොරියාව පොහොසත් කල යුරේනියම් න්‍යෂ්ටික අවි තත්වයට ගෙන ඒමේ ක්‍රියාවලියක් සංවර්ධනය කරන බවට එක්සත් ජනපදය චෝදනා කිරීමත් සමග ය. එහෙත් උතුරු කොරියාව ඉරාකය වැනි වූ ගැටලුවක් නො වී ය. ඊට වඩා එය උතුරු කොරියානු පාලන තන්ත්‍රය හා කලාපයේ අනෙකුත් බලවතුන් අතර සබඳතාවයේ වෙනස්කම් එක්සත් ජනපද අවශ්‍යතාවන්ට එරෙහිව කටයුතු කරනු ඇතැයි එක්සත් ජනපදයට හැඟී යාම යි.

ෆොරින් එෆෙයාර්ස් ලිපියට අනුව ''පියොන්යැංග් වෙත ටෝකියෝවේ හා සියෝල්හි ප්‍රවිශ්ඨය වඩාත් සංහිඳියාවට නැඹුරු වීම මත, පූර්ව මාස 5 වොෂින්ටනය තුල වැඩෙමින් පැවති තැතිගැන්මෙන් ගැටුම දිරිගැන්වූ බව පෙනෙන්ට තිබේ: යුරේනියම් ප්‍රශ්නය මතු කිරීම මගින් බුෂ් පරිපාලනය බලා පොරොත්තු වූයේ ජපානය හා දකුනු කොරියාව බියවද්දා ඔවුන්ගේ ප්‍රතිපත්තීන් ආපසු හැරවීමට යි. ගැටුමට තුඩුදුන් සිද්ධි දාමය 2002 ආපේල් මස ආරම්භ වූයේ, උතුරු හා දකුනු කොරියාව, දෙරට යා කරන දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ හා උතුරු කොරියාවේ කේසොං හි, දකුනු කොරියානු සමාගම් 1000ක් කර්මාන්ත ශාලා පිහිටුවීමට බලාපොරොත්තු වන නව කාර්මික කලාපයක් සංවර්ධනය කිරීමේ, සැලසුම්

ක්‍රියාත්මක කිරීමට තීරනය කිරීමත් සමග ය.''

දෙරට අතර සබඳතා යථාතත්වයට ගෙන ඒමේ සාකච්ඡාවන් සඳහා ජපාන අගමැති උතුරු කොරියාවේ සංචාරය කිරීමත් සමග ඇමරිකානු කනස්සල්ල තවත් වැඩි විය. ''උතුරු කොරියාව පිලිබඳ දකුනු කොරියානු සහ තවත් ප්‍රතිපත්තීන් තම පාලනයෙන් ගිලිහී යාමේ තර්ජනයට මුහුන දුන් බුෂ් පරිපාලනය '(කොරියන්) අර්ධද්වීපයේ විකල්පයන් වෙනත් අයගේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය යටතේ වැඩි වැඩියෙන් මෙහෙයවීමේ සැබෑ හැකියාව දූනගනු ලැබිනැ'යි 2003 ග්‍රීෂ්මයේ එක්සත් ජනපද නාවික හමුදා පාසලේ මූලෝපායික පර්යේෂන දෙපාර්තමේන්තුවේ සභාපති ජොනතන් පොලැක් ලියා ඇත.''

එක්සත් ජනපද ආක්‍රමනයට ගාමක බලය සැපයූ සම්බාධක ක්‍රියාවලිය බිඳී විසිර යෑමෙන්, ඉරාකයේ දී යුරෝපීය පිලිමලුන් වාසි ලබාගනු ඇතැයි පැවති කනස්සල්ල මෙන් ම, එක්සත් ජනපදයේ ආසියානු ප්‍රතිවාදීන්ගේ කටයුතු ''න්‍යෂ්ටික අර්බුදයක්'' නිර්මානය කිරීමෙහි ලා එක්සත් ජනපදය දිරිගන්වනු ලැබිනි. ඉරාකය පිලිබඳ තරගයේ දී ත්‍යාගය වූයේ තෙල් ය. උතුරු කොරියාව සම්බන්ධ කාරනයේ දී එය ලෝකයේ ලාභදායීම ශ්‍රමය කරා පිවිසුමයි. චීන මෝටර් රථ ඉක්මනින් ම ඩොලර් 5000 මිලකට ලෝක වෙලඳපොලට එනු ඇතැයි පසුගිය සතියේ වාර්තාවීමෙන්, පරදුවට තැබී ඇත්තේ කුමක් දැයි ඇඟවේ.

අප එක්සත් ජනපදය ම පරීක්ෂා කර බලන්නේ නම්, බුෂ් තන්ත්‍රයේ මැර කල්ලියක් වැනි ස්වභාවය, ගැඹුරට මුල් බැසගත් ආර්ථික ක්‍රියාවලියක දේශපාලන ප්‍රකාශනය යි. ලාභානුපාතිකය පහල හෙලීමේ පීඩනය ජය ගැනීමට බලන ප්‍රාග්ධනයේ එක් මගක් වැටී ඇත්තේ සන්ත්‍රාසයට පත් මූල්‍ය ව්‍යාපාර හා පරිපූර්න සාපරාධීත්වය හරහා යයි මාක්ස් පෙන්වා දුන්නේ ය. එන්රොන් හා වර්ල්ඩ් කොම් නාමයන් සිතට එන එවන් දෙකක් පමනි.

එවන් සාපරාධීත්වයක ශක්‍යතාවය මතු වන්නේ මූල්‍ය ප්‍රාග්ධනයේ ස්වභාවයෙන් ම ය.

එහි රූපය කුමක්වුවත් මූල්‍ය ප්‍රාග්ධනය සැමවිට වෙනත් තැනක නිෂ්පාදනය කෙරෙන ධනය අත් කර ගැනීමට සම්බන්ධවෙයි. කෙසේ වුවත් මෙයින් කියැවෙන්නේ මූල්‍ය ප්‍රාග්ධනය තනිකරම පරපෝෂිත හා කෙසේ හෝ අහෝසි කල හැකිය යන්න නොවන අතර හොඳ පැත්ත තබා ගන්නා අතර නරක පැත්ත ඉවත් කිරීම යෝජනා කිරීමට බැලූ, ප්‍රෘඩොන්ගේ පටන් ඉදිරියට ධනවාදයේ වියහැකි ප්‍රතිසංස්කාරකයන් මෙන් නො වේ.

සැබැවින් ම මාක්ස් එක් වරකට වඩා පෙන්වා දුන් පරිදි, සංවර්ධනයේ ගාමක බලවේගය වන්නේ නරක පැත්ත ය. මූල්‍ය ප්‍රාග්ධනය හුදෙක් පරපෝෂිත දෙයක් ම නො වේ. එය ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ විසංවාදයන් හා නිශ්චිත අවශ්‍යතාවන් ගෙන් නැගී එන අතර, එහි සමස්ත සංවර්ධනයෙන් උත්තේජනය වේ. මූල්‍ය ප්‍රාග්ධනයේ සමාජ ක්‍රියාකාරිත්වය කොපමන අත්‍යාවශ්‍ය දෙයක් වුවත්, එහි ඒකරාශීවීමේ ක්‍රමය පවතින්නේ අතිරේක වටිනාකම සෘජුව ම උපුටා ගැනීම වෙනුවට වෙනත් තැනක දී අත් කර ගනු ලබන අතිරික්ත වටිනාකම හිමිකර ගැනීම ලෙසින් ය.

මූල්‍ය ප්‍රාග්ධනයේ තර්කානුකූල ක්‍රියාකාරිත්වය ලෙස අප හඳුන්වනු ලබන දෙය එනම් සමස්තයක් ලෙස හෝ ප්‍රාග්ධනය සඳහා එය ඉටු කරන අත්‍යාවශ්‍ය සමාජ ක්‍රියාකලාපයට හිලව් වසයෙන්, ධනය අත්පත් කර ගැනීම හා සොරකම අතර යම් කිට්ටු සම්බන්ධයක් පවතින බව මෙහි අර්ථය යි. ශ්‍රමය සූරාකෑමෙන් ද නිෂ්පාදන ක්‍රියාවලියෙන් ද සැලකිය යුතු ලාභානුපාතිකයක් උපුටාගැනීමේ දී ප්‍රාග්ධනයට බොහෝ දුෂ්කරතාවන්ට මුහුන පෑමට සිදුවන අතර සම්බන්ධතාවය ද තවත් බොඳ වී යයි.

මෙම ක්‍රියාවලීන්ගේ පුද්ගලාරෝපනය බුෂ් පාලන තන්ත්‍රය තුල අපට හමු වේ. ප්‍රථම එම්බීඒ ජනාධිපති වසයෙන් ඔහුගේ පූර්වගාමීන් කිසිවෙකුටත් වඩා ඔහු මෙම ස්ථරයන් සෘජුව ම නියෝජනය කරන අතර පරිපාලනයේ සාපරාධී ස්වභාවය, ධනය ඒකරාශී කිරීමේ ක්‍රියාවලියෙන් වැඩි දුරටත් ගලා එයි.

ලෝක ධනේශ්වරයට නව සමතුලිතයක් පිහිටුවිය හැකි ද? අපේ විශ්ලේෂනය පෙන්නුම් කරන්නේ එසේ නොහැකි බවයි. පැරනි පර්යාය දෙදරවාලමින් ලෝක ආධිපත්‍යය සඳහා වූ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ධාවනය සැබැවින් ම පැන නගින්නේ ලෝක ආර්ථිකය ඇතුලත විසංවාදයන්ගෙනි. මෙය අපගේ ඉදිරිදර්ශනය සඳහා කේන්ද්‍රීය කාරනය යි. ඇමරිකානු මිලිටරි වාදයේ ප්‍රචන්ඩ පුපුරා යෑම ඇමරිකානු ප්‍රශ්නයක් නොව, සමස්තයක් ලෙස ධනවාදය ලඟා වී ඇති ඓතිහාසික වංකගිරියෙහි ප්‍රකාශනය යි. අපි වඩාත් සංයුක්තව බලමු. අප 20වැනි සියවසේ ඉතිහාසය විමසා බලන්නේ නම් එවිට පැහැදිලිව දිස්වන්නේ, ධනවාදී පර්යාය පවත්වා ගෙන යාමේ වඩාත් ප්‍රබල වෛෂයික සාධකය එක්සත් ජනපද ධනේශ්වරය සතු වූ දැවැන්ත සම්පත් බව යි. රුසියානු විප්ලවයෙන් අත් කර ගත් සමාජවාදී ජාත්‍යන්තරවාදයේ ක්‍රියාමාර්ගය පසුකාලීනව පාගාදැමීමෙන් පැනනැගි කම්කරු පන්ති නායකත්වයේ පාවදීම් මත ධනේශ්වරය දැඩි සේ රැඳීගත් බව සත්‍යයකි. එහෙත් මෙම පාවාදීම් කොතෙක් ගැඹුරු හා දුර දිග යන්නේ වුවත් ඒවා පවා එක්සත් ජනපද රැකවරනය යටතේ නිශ්චිත ප්‍රසාරනයක් ධනවාදයට සපයා දීමට සැහුනේ නැත. එම වාතාවරනය මුලුමනින් ම පරිවර්තනය වී තිබේ. එක්සත් ජනපදය තව දුරටත් ගෝලීය ස්ථායීතාවක් නො සපයන අතර එය ලෝක

දේශපාලනය තුල වඩාත් අස්ථාවර හා පුපුරනසුලු සාධකය බවට ද පත්ව තිබේ.

මෙහි අර්ථය අප දැවැන්ත සමාජ හා පන්ති අරගලයන්ගේ නව යුගයකට ත් යුද්ධයන්ගේ හා විප්ලවයන්ගේ නව අවධියකටත් මුහුන දී සිටින බවයි. ප්‍රථම ලෝක සංග්‍රාමයේ ආරම්භක දිනවල, කම්කරු පන්තිය ධනවාදයේ අධිරාජ්‍යවාදී පලහිලව්වට මුහුන දීමට, සමාජවාදී විප්ලවයේ තමන්ගේ ක්‍රමවේදය හා ක්‍රියාමාර්ගය වර්ධනය කරගැනීමේ ද ලෝක ආර්ථිකයේ සමාජවාදී ප්‍රතිසංවිධානය සඳහා සටන්වැදීම දවසේ කර්තව්‍යය ලෙස සලකා ඊට මුහුන දීමේ අවශ්‍යතාවය ද පිලිබඳව ට්‍රොට්ස්කි ලිවී ය.

2003 ඉරාක යුද්ධයට එරෙහිව අප දුටු පෙලපාලි දේශපාලන රූපයක් ගැනීමට නියමිතව ඇති අතර වඩ වඩාත් භූගෝලීය ස්වභාවයක් ගන්නා වූ පන්ති අරගලයේ නව වටයකට අප සූදානම් විය යුතු ය. මෙම නව තත්වයට වඩාත් තීරනාත්මක වන අපගේ සූදානම, ජාත්‍යන්තර ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය සංවර්ධනය සඳහා ලෝක බලාපොරොත්තු හා සමාජවාදය සඳහා 21 වැනි සියවස තුල අරගලය හා ඒ සඳහා සටන්වැදීමට පෙරට ඇදෙන කම්කරුවන් ද තරුනයන් ද පුහුනු කරගැනීමේ වගකීම භාර ගැනීම බවට පත් වෙයි.

© www.wsws.org